# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ල, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/09/14/02/17

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2020.08. 07

චක්‍රලේඛ අංකය : 06/2020 (I)

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විදුහල්පතිවරුන් වෙත,

## පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම

පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2020.01.17 දිනැති 06/2020 චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛයට අමතර වශයෙන් මෙම චක්‍රලේඛයේ පහත සංශෝධනයන් මින් ඉදිරියට බලපැවැත්වේ.

01. චක්‍රලේඛයෙහි 4.2 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"පහ ශ්‍රේණි ශිෂ්‍යාධාරලාභීන් අතරින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේදී පළමුවර සුදුසුකම් ලබා අ.පො.ස.(උසස් පෙළ) හැදෑරීමට 12 ශ්‍රේණියට ඇතුළත් වන ශිෂ්‍යාධාර හිමි සිසුන් සඳහා සහ 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා ශිෂ්‍යාධාර දීමනා වසර දෙකක උපරිම කාල සීමාවක් සඳහා හිමිකම ලැබේ."

02. චක්‍රලේඛයෙහි 7.8.1 උප වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"යම් සාධාරණ හේතුවක් මත බැංකු ගිණුම් වැසීමට/ වෙනස් කිරීමට බැංකුව වෙත ශිෂ්‍යාධාරලාභියා පාසල් අවධියේදී පැමිණෙන්නේ නම් විදුහල්පතිවරයා විසින් අදාළ බැංකුව වෙත ඒ සඳහා තම නිර්දේශය (ඇමුණුම 05) අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිතව අදාළ බැංකුව දැනුවත් කළ යුතුය."

03. චක්‍රලේඛයෙහි 12 වන වගන්තිය වන විශේෂ අවස්ථා මත ශිෂ්‍යාධාර ලබාදීම පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"තමන්ට හිමි ශිෂ්‍යාධාර ලබා නොගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් වේ නම් හෝ යම් හෙයකින් නවත්වනු ලැබූ ශිෂ්‍යාධාර සංඛ්‍යාවක් වේ නම්, එම ශිෂ්‍යාධාර සංඛ්‍යාව පහත හේතු මත 05 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු ඉක්ම වූ නමුත්, ශිෂ්‍යාධාර හිමිකම් නොලැබූ සිසුන් හට ලබා දිය හැකිය. ඒ සඳහා තහවුරු කරන ලද ලේඛන සලකා බලා අදාළ පාසලේ විදුහල්පතිගේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රධාන ගණකාධිකාරී (මුදල්) හා 05 ශ්‍රේණි ශිෂ්‍යාධාර විෂය භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂගෙන් සමන්විත කමිටුවක අනුමැතියෙන් ලබා දීමේ හැකියාව ඇත."